# පළිබෝධනාශක භාවිතයේදී වැදගත් වන උපදෙස්

## ආරක්ෂාකාරීව හා නිවැරදිව පළිබෝධනාශක භාවිතා කිරීම තුලින් අපිත් අපේ මුදලුත් පරිසරයත් ආරක්ෂා කර ගනිමු.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව - 2025



**ශ්‍රී ලංකාව තුල පළිබෝධනාශක සහ පොහොර ආරක්ෂාකාරීව සහ නිවැරදිව භාවිතය ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය (SAFE)**

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

SAFE ව්‍යාපෘතිය

ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය

# පළිබෝධනාශක භාවිතයේදී වැදගත් වන උපදෙස්

**ආරක්ෂාකාරිව හා නිවැරදිව**
**පළිබෝධනාශක භාවිතා කිරීම තුලින්**
**අපිත් අපේ  මුදලුත් පරිසරයත්**
**ආරක්ෂා කර ගනිමු.**



ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය (JICA) අනුග්‍රහයෙන් ක්‍රියාත්මක වන ශ්‍රී ලංකාව තුළ පළිබෝධනාශක සහ පොහොර ආරක්ෂාකාරීව සහ නිවැරදි භාවිතය ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය මගින් පළිබෝධනාශක භාවිතා කරන ගොවීන්ගේ සහ කෘෂි ව්‍යාප්ති නිලධාරීන්ගේ පරිශීලනය සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිර්දේශයන්ට අනුකූලව මෙම අත්පොත සකස්කර ඇත.


**තාක්ෂණික මගපෙන්වීම හා උපදේශකත්වය:**

ආචාර්ය ජීවනී ප්‍රසාදිකා මාරසිංහ.
පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්,
පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව.

**අන්තර්ගතයේ නිර්මාණකරුවන්:**

1. කැලුම් නිශාන්ත වඩුමේස්ත්‍රිගේ.
   ව්‍යාපෘතියේ යහපත් කෘෂිකාර්මික පිළිවෙත් පිළිබඳ විශේෂඥ
2. පි. සනත් වික්‍රමතිලක.
   ව්‍යාපෘතියේ යහපත් කෘෂිකාර්මික පිළිවෙත් පිළිබඳ විශේෂඥ
3. එම්. ඩබ්ලිව්. ඉසුරි තෙන්නකෝන්.
   ව්‍යාපෘතියේ පුහුණු ආධාරක සම්පාදක

කාටූන්, පිටකවර සහ පිටු නිර්මාණය:
අවන්ත ආටිගල



මුද්‍රණය:
නෙත්වින් ප්‍රින්ටර්ස් - ගැටඹේ
දු. ක. 081 238 6908

2025 නොවැම්බර්

## 1 ඔබේ වගාවේ ඔබ දකින හානිය පළිබෝධ හානියක්ද? එසේ නොමැතිනම් වෙනත් හානියක්ද? යන වග තීරණය කර ගැනීම.



- වගාවේ ඔබ දකින හානියට හේතුව පළිබෝධකයෙක්ද? (රෝගයක්ද? කෘමි/පණු හානියක්ද? පෝෂණ ඌනතාවක්ද? වැස්සෙන් සුළඟින් වූ හානියක්ද? නැතිනම් වෙනත් හෙතුවක්ද? යන වග තහවුරු කර ගන්න.
- ඇත්තම හේතුව පළිබෝධ හානියක් නම්,

## 2 පළිබෝධකයා නිවැරදිව හඳුනා ගනිමු.

- මෙහිදී හානිය සිදුකරන පළිබෝධකයා.
  - කෘමියෙක්ද? - කෘමියෙක් නම් ඒ කවරෙක්ද?
  - වටපණුවෙක්ද?
  - වෛරස්/ දිලීර/ බැක්ටීරියා රෝගී තත්වයක්ද? යන වග නිවැරදිව තහවුරු කර ගන්න.



පළිබෝධකයා නිවැරදිව හඳුනා ගැනීම ගැටළුකාරී නම්, වෙනත් නිවැරදි ක්‍රමයක් මඟින් හඳුනා ගැනීමට කෘෂිකර්ම උපදේශකගේ/කෘෂි ක්ෂේත්‍ර නිලධාරීන්ගේ සහාය ලබා ගන්න !



## 3 පළිබෝධ හානිය පාලනය සඳහා කටයුතු කළයුතුද? නැද්ද? යන්න තීරණය කිරීම.

- සමහර පළිබෝධ හානි, එම හානියේ ස්වභාවය හා දරුණුභාවය අඩුනම් පාලනය සඳහා කටයුතු කිරීම අවශ්‍ය නොවේ.
- නමුත් ඇතැම් පළිබෝධකයන් හා රෝග මුලදීම පාලනය කිරීම කළයුතුය.

**උදාහරණ**

වෛරස් රෝග ව්‍යාප්ත කරන කෘමීන් (උදා: සුදු මැස්සා) හැකි ඉක්මනින්, ආරම්භයේදීම පාලනය කළයුතු වේ.

- පළිබෝධ හානිය පාලනය කළයුතු බවට තහවුරු වේ නම් පමණක් පළිබෝධකයා මර්දනය සඳහා සුදුසු ක්‍රමයක් යෙදිය යුතුය. එම මර්දන ක්‍රමය රසායනික ක්‍රමයක් හෝ රසායනික නොවන ක්‍රමයක් විය හැක.

## 4 පළිබෝධ හානිය පාලනයට වඩාත්ම සුදුසුම ක්‍රමය තීරණය කිරීම.

- මුලින්ම හඳුනාගත් පළිබෝධකයා මර්දනය කිරීමට රසායනික නොවන වෙනත් පාලන ක්‍රමයක් භාවිතා කළ හැකි දැයි සලකා බලන්න.
- මේ සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් නිර්දේශිත හෝ අත්හදා බලා ඇති ක්‍රමවේදයක් යොදා ගැනීම වඩා සුදුසුය.
- එහිදී හඳුනාගත් රසායනික නොවන ක්‍රමවේදයක් හෝ කිහිපයක් යොදාගනිමින්, නොපමාව, නිවැරදිව පළිබෝධකයා පාලනය කරන්න.

**උදාහරණ**

වම්බටු වගාවේ පිටිමකුණා (Mealybug) පාලනයේදී: මුලදීම පිටිමකුණන් සහිත ශාක කොටස් කපා වගා භූමියෙන් ඉවත්කර විනාශ කිරීම.

අර්තාපල් වගාවේ හිටු මැරීම සිදු වූ මුළු ශාකයම (පසුත් සමග) ඉවත් කොට විනාශ කිරීමට වග බලාගන්න.



- රසායනික නොවන ක්‍රම එකක් හෝ කිහිපයක් යොදාගනිමින් පළිබෝධකයා මර්දනය කල නොහැකි නම් පමණක් පළිබෝධනාශකයක් යෙදීමට කටයුතු කරන්න.
- පළිබෝධකයාගේ ස්වභාවය අනුව එනම් කෘමි හානි සඳහා සංස්ථානික හෝ ස්පර්ශ විෂ ආකාරයෙන් ක්‍රියා කරන කෘමිනාශකයක් ද, දිලීර රෝග සඳහා දිලීරනාශකයක් ද ලෙස අදාල පළිබෝධනාශකයක් යෙදීමට කටයුතු කරන්න.
- කෘෂි නිලධාරීන්ගේ උපදෙස් මත, අවශ්‍ය නම් පමණක් රසායනික නොවන ක්‍රම සමග රසායනික පළිබෝධනාශක සුදුසු ආකාරයට භාවිතා කල හැකි අවස්ථා හඳුනා ගන්න.
- පළිබෝධ මර්දනය සඳහා සෑම විටම යොදාගත හැකි සෑම ඵලදායී  ක්‍රමවේදයක්ම ඒකාබද්ධව යොදා ගන්න.



# 5 නිවැරදිව පළිබෝධනාශකයක් තෝරා ගන්නේ කෙසේද?

- මෙහිදී අපි කාරණා දෙකක් ගැන සලකා බැලිය යුතුයි.

I. පළිබෝධකයාගේ හානියේ ස්වභාවය.

II. මිනිසුන්ට (අපිට) විෂ බව අවම මට්ටමක පැවතීම.

## 5. 1 පළිබෝධකයාගේ හානියේ ස්වභාවය අනුව පළිබෝධනාශකය තෝරා ගැනීම.

ඒ සඳහා මුලින්ම

- හානිය සිදුකරන පළිබෝධකයා / පළිබෝධකයින්
- පළිබෝධ හානියේ ස්වභාවය හඳුනා ගන්න.


- ඔබ මිලදී ගත යුතු පළිබෝධනාශකය කුමක් ද කියා තීරණය කළයුතු වන්නේ ඉහත කාරණා දෙකම සළකා බැලීමෙනි.
- වගා හානියේ ස්වභාවය යුෂ උරාබීමේ තත්වයක් හෝ පත්‍ර කා දැමීමේ තත්වයක් නම් මෙම හානි දෙක සඳහා නිර්දේශිත පළිබෝධනාශක වර්ග බොහෝ විට වෙනස් විය හැක.
- කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් මේ එක් එක් අවස්ථා සඳහා නිර්දේශ කරන ලද පළිබෝධනාශක වර්ග පළිබෝධනාශක නිර්දේශ අත්පොතේ සඳහන් කර ඇත.
- එමනිසා පළිබෝධනාශකය තෝරා ගැනීම සඳහා පළමුව කෘෂි ව්‍යාප්ති නිළධාරීන්ගේ උපදෙස් ලබා ගැනීම සුදුසු වේ.
- පළිබෝධකයන් ගණනාවක් එකවරම වගාවට හානිකරන විටක දී යෙදිය යුතු පළිබෝධනාශක වර්ගය තීරණය කිරීමේදී වඩා වැඩි අවධානයක් දිය යුතු වේ.

- මෙහිදී ඇතැම් විට එක පළිබෝධනාශකයකින්, පළිබෝධකයින් වර්ග කිහිපයක් පාලනය කල හැකි දැයි බලන්න.

**වගා හානිය සිදු කරන පළිබෝධකයා කවරෙක්ද, එය සිදු කරන ආකාරය කෙසේද යන්න හරියටම නොදැන පළිබෝධනාශක මිලදී ගැනීම නොකරන්න !**


## 5. 2 මිනිසුන්ට (අපිට) අවම විෂ සහිත වන පළිබෝධනාශක තෝරා ගැනීම.

- යම් පළිබෝධකයෙක් පාලනය සඳහා නිර්දේශ කර ඇති ඕනෑම පළිබෝධනාශකයක් එම පළිබෝධකයා රසායනිකව මර්දනය සඳහා සුදුසු වෙනවා.
- එහෙනම් මෙහි දී අප වගකීමෙන් කළයුතු වැදගත්ම දෙයක් තියනවා.
  - ඒ තමයි, තෝරා ගන්නා පළිබෝධනාශකය මිනිසා ඇතුළු ක්ෂිරපායී සතුන්ට ඇති කරන විෂබව නැතහොත් අන්තරාදායකබව අඩු පළිබෝධනාශකයක් බව තහවුරු කරගැනීම.
  - ඒක කරන්නේ කොහොම ද?
  - ඒක හරිම පහසුයි.
  - සැම පළිබෝධනාශක ලේබලයකම වර්ණ දාරයක් තිබෙනවා.



- පළිබෝධනාශකයේ ලේබලයේ ඇති මෙම වර්ණ දාරය මගින් එම පළිබෝධනාශකය මිනිසා ඇතුළු ක්ෂීරපායී සතුන්ට ඇතිකරන විෂබව නැතහොත් අන්තරාදායකබව පිළිබඳ අදහසක් ලබා දෙනවා.
- වර්ණ දාරය කොළ පාට නම් එය ක්ෂීරපායීන්ට සුළු විෂ සහිත වෙනවා. (නිතරම ඔබේ තේරීම කොළ පාට වර්ණ දාරය සහිත පළිබෝධනාශකයක් කරගන්න.)
- ඔබට වෙළඳපලේ මිලදී ගත හැකි නිර්දේශිත පළිබෝධනාශක නිෂ්පාදන වල වර්ණ දාර කොළ, නිල් සහ කහ පැහැති වේ.
- ඒවා අපට විෂ වන ආකාරය කොළ පැහැය සහිත නිෂ්පාදන වල අවම වන අතර, පිළිවෙලින් නිල් සහ කහ ලෙස විෂ බව වැඩිවේ.

පළිබෝධනාශක ලේබලයේ අන්තර්ගත වර්ණ දාරය, ඊට අදාල විෂ පන්තිය සහ සංකේත පහතින් දක්වා ඇත.



- වර්ණ දාරය රතු පාට නම් එම පළිබෝධනාශකය මිනිසා ඇතුළු ක්ෂීරපායීන්ට උග්‍ර විෂ සහිත වෙනවා. උග්‍ර විෂ සහිත රතු වර්ණ දාරය සහිත පළිබෝධනාශක ඔබට වෙළෙඳපොළෙන් මිලදීගත නොහැක. මෙවැනි පළිබෝධනාශක විශේෂී අවස්ථාවලදී භාවිතා කරන අතර ඒ සඳහා පුහුණුව ලබා ඇති පුද්ගලයෙකුගේ හෝ බලපත්‍ර ලාභී ආයතනයක සේවය ලබා ගතයුතුය.
- රතු වර්ණ දාරය සහිත පළිබෝධනාශක මගින් මිනිසාට ඉතා තද බල කෙටි කාලීන මෙන්ම දිගු කාලීන සෞඛ්‍ය හානි ඇති කරනවා.
- සමහර ගොවියෝ මෙම වර්ණ දාරය පිළිබඳ අදහස වැරදියට තේරුම් ගෙන, අනවබෝධයෙන්, ඉතා විෂ වන්නේ පළිබෝධකයින්ට යැයි සිතා, නිතරම ඉතා විෂ පළිබෝධනාශක භාවිතා කරනවා. ඒක ඉතාම බරපතල තත්ත්වයක්.

## 6 පළිබෝධනාශක ලේබලයේ සඳහන් නිර්දේශ සහ අනෙකුත් තොරතුරු සැලකිල්ලෙන් කියවා ඒ අනුව ක්‍රියා කරමු.

- ලේබලයේ අකුරු කියවීමට අපහසු නම් වෙනත් අයෙකුගේ සහාය ලබා ගන්න. නැතහොත්, පළිබෝධනාශක මිලට ගන්නට යන සෑම විටම විශාලක කාචයක් (අත් කාචයක්) ඔබේ පසුම්බියේ දමා රැගෙන ගොස් එය භාවිතා කොට ලේබලය කියවන්න.




ලේබලයේ ඇති පහත සඳහන් කරුණු අවබෝධ කර ගෙන කටයුතු කරමු.

- කිනම් පළිබෝධකයන් මර්දනය සඳහා යෝග්‍ය වන්නේද?
- හෙක්ටාරයකට එසේ නොමැති නම් අක්කරයකට මෙම පළිබෝධනාශකයෙන් කොපමණ ප්‍රමාණයක් යෙදිය යුතුද?
- පළිබෝධනාශකයේ කිනම් ප්‍රමාණයක් එක් වරකට ඉසින යන්ත්‍රයට එක් කල යුතුද?

  ඔබේ වගා භූමියේ ප්‍රමාණය අනුව වගාවට අවශ්‍ය පළිබෝධනාශක ප්‍රමාණය සහ තෙල් ටැංකි ගණන, ගණනය කරන ආකාරය අංක 15 දී (පිටු අංක 32) පැහැදිලි කර ඇත.

- පළිබෝධනාශකය යෙදිය යුතු කාලාන්තරය (කොතරම් දින ගණනකින් පසුව නැවත යෙදිය යුතුද යනවග)

පළිබෝධනාශකය පළිබෝධකයා පාලනය කිරීමට ක්‍රියා කරන ආකාරය පිළිබඳව කියනු ලබන කේතයක් (අංකයක් ලෙස හෝ ඉංග්‍රීසි අකුරු ද සහිත අංකයක් ලෙසින්) ලේබලයේ ඇත.






- අනිවාර්යෙන් පෙර වතාවේදී භාවිතා කළ පළිබෝධනාශකයේ කේත අංකයට වඩා වෙනස් කේත අංකයක් සහිත පළිබෝධනාශකයක් මේ කන්නයේදී භාවිතා කිරීමට වගබලා ගන්න.
- එසේ කිරීමෙන් පළිබෝධකයින් එකම පළිබෝධනාශකයකට හුරුවීම නැතහොත් ප්‍රතිරෝධී වීම වළක්වා ගත හැක.
- එකම පළිබෝධනාශකයක් දිගින් දිගටම භාවිතා කිරීම් නිසාවෙන් පළිබෝධකයින්ගේ ප්‍රතිරෝධීතාවය වැඩි වුවහොත් (පළිබෝධනාශකවලට ඔරොත්තු දෙන තත්වයක් ඇති වුවහොත්) තවදුරටත් පළිබෝධනාශක භාවිතය නිශ්ඵල වීමට ඉඩ ඇත.
- තවද, පළිබෝධනාශකයක් ගැන කරුණු ඉදිරිපත් කිරීමේදී, විමසීමේ දී හෝ පැමිණිලි කිරීමේ දී මෙම කේත අංකය (කාණ්ඩ අංකය) ඉතා වැදගත් වේ.

**පෙර අස්වනු කාලය:**

බෝග අස්වනු නෙලන දිනයත් අවසන් වරට පළිබෝධනාශක ඉසීම සිදු කරන දිනයත් අතර කාලය පෙර අස්වනු කාලය ලෙස හඳුන්වයි. පෙර අස්වනු දින ගණන සෑම පළිබෝධනාශක ලේබලයකම නිසි ලෙස සඳහන් කර ඇත. එය අනුගමනය නොකළොත්, එවැනි අස්වනු නෙලන සහ පාරිභෝජනය කරන අයට අහිතකර සෞඛ්‍ය ගැටලු ඇතිවීම සිදු වේ.

පහත ඇති ආදර්ශ ලේබලය කියවා කරුණු හොඳින් අවබෝධ කරගමු.

| M5 | දිලීරනාශකයකි<br>பங்கசு நாசினி<br>FUNGICIDE | අනිවාර්යෙන් අගුළු ලා තැබිය යුතුයි. බඳුන විවෘත කිරීමට පෙර ආරක්ෂක උපදෙස් හොඳින් කියවන්න.<br>பூட்டப்பட்டிருக்க வேண்டும். கொள்கலனைத் திறப்பதற்கு முன் பாதுகாப்பு வழிமுறைகளை கவனமாகப் படியுங்கள். | වස<br>விஷம்<br>POISON |
|---|---|---|---|

# ඒ බී සී ක්ලෝරොතැලොනිල්

ක්ලෝරොතැලොනිල් 500 ග්‍රෑ/ලී එස්.සී.

# ஏ பி சி குளோர்தலோனில

குளோர்தலோனில் 500 கி/லி எஸ்.சி.

# A B C Chlorothalonil

**Chlorothalonil 500 g/l SC**

**M5** — කේතය සහිත දිලීරනාශක එක් ක්ෂේත්‍රයක් සඳහා අඛණ්ඩව දීමෙන් වලකින්න.
குறியீட்டு பூஞ்சைக் கொல்லிகளை ஒரே பகுதியில் தொடர்ந்து பயன்படுத்துவதைத் தவிர்க்கவும்.

පෙර අස්වනු කාලය දින 14 යි. අවශ්‍ය නම් නැවත යෙදීම දින 10-14 අතර කාල පරාසයකින් සිදුකරන්න.
அறுவடைக்கு முந்தைய காலம் 14 நாட்கள். தேவைப்பட்டால், 10-14 நாட்கள் இடைவெளியில் மீண்டும் பயன்படுத்தவும்.

ලියාපදිංචි කරන ලදී. பதிவு செய்யப்பட்டது. Registered.

| | | | | |
|---|---|---|---|---|
| ලි. ප. අංකය:<br>எல். பி. எண்:<br>Reg. No: | M3405657 | | කාණ්ඩ අංකය:<br>தொகுதி எண்:<br>Batch No : | 0851218 |
| සක්‍රිය කාලය:<br>செயலில் உள்ள நேரம்:<br>Shelf Life: | 2 | වසර<br>ஆண்டு<br>Years | නිෂ්පාදිත දිනය:<br>உற்பத்தி தேதி:<br>Date of Manufacturing: | 13.08.2025 |
| නිෂ්පාදිත රට:<br>உற்பத்தி நாடு:<br>Country of Origin: | ජර්මනිය<br>ஜெர்மனி<br>Germany | | නැවත ඇසුරුම් කල දිනය<br>மறு தொகுப்பு தேதி:<br>Date of Re-Packing : | 13.10.2025 |
| ශුද්ධ පරිමාව:<br>நிகர அளவு:<br>Net Content: | 200 | මි.ලී.<br>மி.லி.<br>ml | උපරිම සිල්ලර මිල (රු):<br>அதிகபட்ச சில்லறை விலை (ரூ.)<br>Maximum Retail : Price (Rs.): | 1,100/- |

ආයතන අංකය / நிறுவன எண் / Establishment No: ROP-IN/VIX/C4

ලියාපදිංචිය: ඒ බී සී හෝල්ඩින් පීඑල්සී සමාගම, තැ. පෙ. 1056, ගැටඹේ, පේරාදෙණිය.
பதிவு செய்பவர்: ஏ பி சி ஹோல்டிங் பிஎல்சி, பி.ஓ. பெட்டி 1056, கட்டபே, பேராதனை.
Registrant: A B C Holding PLC, P.O. Box 1056, Gatabe, Peradeniya.
දු.ක. / தொ.பேசி. / TEL 081 238 8135

A B C Holding

අවදානම් සහිතයි ஆபத்தானது CAUTION

කේත අංකය

පෙර අස්වනු කාලය

ලියාපදිංචි කළ බව සඳහන් තීරුව

නිෂ්පාදිත දිනය

ජීව කාලය

ලියාපදිංචි තොරතුරු

වර්ණ දාරය

අවවාද සංකේත

## නිර්දේශ සහ උපදෙස්

| භාවිතය සඳහා නිර්දේශ සහ උපදෙස් / பயன்பாட்டிற்கான சிபாரிசுகள் மற்றும் ஆலோசனைகள் | | භාවිතය සඳහා නිර්දේශ සහ උපදෙස් / பயன்பாட்டிற்கான சிபாரிசுகள் மற்றும் ஆலோசனைகள் | | |
|---|---|---|---|---|
| වගාව<br>பயிர்ச்செய்கை | පාලනය වන දිලීර රෝග<br>கட்டுப்படுத்தப்படும் பங்கசு நோய்கள் | මිශ්‍රණ අනුපාතය<br>கலவை விகிதம் | යෙදිය යුතු ප්‍රමාණය<br>இடவேண்டிய அளவு | |
| | | | පෙර වර්ධන අවදිය<br>ஆரம்ப வளர்ச்சிப் பருவம் | පසු වර්ධන අවදිය<br>பிந்திய வளர்ச்சிப் பருவம் |
| මිරිස්, මාළු මිරිස්, බෙල් පෙපෙර්<br>மிளகாய்,<br>கறிமிளகாய்,<br>குடைமிளகாய் | ඇන්ත්‍රැක්නොස්,<br>මල් අංගමාරය,<br>පිටිපුස් රෝගය,<br>යටිපුස් රෝගය,<br>පයිටොප්තෝරා අංගමාරය<br>அந்திரக்நோஸ்,<br>பூ வெளிறல்,<br>தூள்பூஞ்சண நோய்,<br>கீழ் பூஞ்சண நோய்,<br>பைதொப்டரா வெளிறல் | මි. ලී. 48ක් ජලය ලීටර 16<br>48 மில்லி லீற்றர் 16 லீற்றர் நீரிற்கு | මි.ලී. 960 ක් හෙක්ටයාරයකට (මි.ලී. 384 ක් අක්කරයකට)<br>ஒரு ஹெக்டயருக்கு 960 மில்லி லீற்றர் (ஒரு ஏக்கரிற்கு 384 மில்லி லீற்றர்) | මි.ලී. 1920 ක් හෙක්ටයාරයකට (මි.ලී. 768 ක් අක්කරයකට)<br>ஒரு ஹெக்டயருக்கு 1920 மில்லி லீற்றர் (ஒரு ஏக்கரிற்கு 768 மில்லி லீற்றர்) |
| කැරට්<br>கரட் | ඔල්ටනේරියා අංගමාරය, පිටිපුස් රෝගය<br>ஓல்டனேரியா வெளிறல்,<br>தூள்பூஞ்சண நோய் | | | |
| පතෝලා, පිපිංඤ්ඤා, වැටකොළු, කරවිල, වට්ටක්කා, ගර්කින් ඇතුළු කුකබිටෙසි කුලයේ බෝග,<br>புடோல், வெள்ளரி, பீர்க்கு, பாகல், பூசணி, கேகின் உட்பட குக்கர்படேசியே குடும்பப் பயிர்கள் | ඔල්ටනේරියා අංගමාරය, පිටිපුස් රෝගය<br>ஓல்டனேரியா வெளிறல்,<br>தூள்பூஞ்சண நோய் | | | මි.ලී. 2400 ක් හෙක්ටයාරයකට (මි.ලී. 960 ක් අක්කරයකට)<br>ஒரு ஹெக்டயருக்கு 2400 மில்லி லீற்றர் (ஒரு ஏக்கரிற்கு 960 மில்லி லீற்றர்) |
| තක්කාලි, අර්තාපල්<br>தக்காளி,<br>உருளைக்கிழங்கு | පූර්ව අංගමාරය හා පශ්චිම අංගමාරය<br>முக்கூட்டு வெளிறல் மற்றும் பிற்கூட்டு வெளிறல் | | | මි.ලී. 1920 ක් හෙක්ටයාරයකට (මි.ලී. 768 ක් අක්කරයකට)<br>ஒரு ஹெக்டயருக்கு 1920 மில்லி லீற்றர் (ஒரு ஏக்கரிற்கு 768 மில்லி லீற்றர்) |

අවදානම් සහිතයි  ஆபத்தானது  CAUTION




- එසේම පළිබෝධනාශකයක් තෝරා ගැනීමේ දී, එහි ලේබලය කියවා;

  - එහි නිෂ්පාදිත දිනය මෙන්ම ජීව කාලය නැතහොත් සක්‍රිය කාලය පිළිබඳ ව සැළකිලිමත් වන්න.
  - ජීව කාලය මඟින් එහි කල් ඉකුත් වීම පිළිබඳව කියනු ලබයි.
  - ජීව කාලය අවුරුදු 2 ක් විය යුතුය. එනම් පළිබෝධනාශකය නිෂ්පාදනය කළ දිනයේ සිට වසර 2ක කාලයක් තුළ එය භාවිතයට ගත යුතුවේ.
  - ජීව කාලය, ඇසුරුම් කල දිනයේ සිට වසර 2ක් ඉදිරියට ලෙස සැළකීම වැරදි බව මතක තබා ගන්න.
  - ජීව කාලය ඉක්මවූ නැතහොත් කල් ඉකුත් වූ පළිබෝධනාශක සහ පළිබෝධනාශක ලියාපදිංචි පනත යටතේ ලියාපදිංචි නොකළ පළිබෝධනාශක නිෂ්පාදන ප්‍රතික්ෂේප කරන්න.
  - පළිබෝධනාශක ලියාපදිංචි පනත යටතේ ලියාපදිංචි කළ බව තහවුරු කර ගැනිමට එහි ලේබලයේ පහත සඳහන් වගන්තිය සටහන්ව තිබේදැයි පරීක්ෂා කර බලන්න.

"1980 අංක 33 දරණ පළිබෝධනාශක පාලන පනත යටතේ ලියාපදිංචි කරන ලදී." යනුවෙන් සඳහන් කොට තිබේදැයි බලන්න.

නමුත් ලේබලය කුඩා සහ ඉඩකඩ සීමාසහිත අවස්ථාවලදී මෙම වැකිය 'ලියාපදිංචි කරන ලදී' යනුවෙන් පමණක් සඳහන්කර ඇති ලේබල ඔබට බහුලව හමුවිය හැක.




## 7 අවශ්‍ය නිවැරදි ප්‍රමාණය මිලදී ගැනීම.


- ඉහත කී සියළුම වැදගත් කරුණු තහවුරු කරගත් පසුව කළ යුත්තේ අවශ්‍ය පළිබෝධනාශක ප්‍රමාණය මිළදී ගැනීමයි.
- සෑම විටම බෝග වගා ක්ෂේත්‍රයේ ප්‍රමාණය සලකා බලා, එම වගා බිම් ප්‍රමාණය සඳහා එක් වතාවක් හෝ උපරිම වශයෙන් දෙවතාවක් යෙදීමට අවශ්‍යවන ප්‍රමාණය පමණක් මිලදී ගන්න.
  ඉදිරියේ දී වතාවන් ගණනාවක් යෙදිය යුතුයයි සිතා වැඩිපුර මිලදී නොගන්න. ඔබේ වගා භූමියට අවශ්‍ය පළිබෝධනාශක ප්‍රමාණය ගණනය කරන ආකාරය අංක 15 දී (පිටු අංක 32) විස්තර කර ඇත.
- පළුදු වූ හෝ කාන්දුවන (මූඩිය තුළින් හෝ භාජනය සිදුරු වීමෙන්) හෝ ඉදිමුණු හෝ ඇතුලට ගිලා බැස ඇති ඇසුරුම් සහිත පළිබෝධනාශක බඳුන් මිළදී ගැනීමෙන් වළකින්න.
- අඩු මිළක් යටතේ වත් එවැනි කාන්දු සහිත හෝ කල් ඉකුත් වූ පළිබෝධනාශක මිළදී ගැනීමෙන් වළකින්න.





කාන්දුවන හෝ ඉදිමුණු හෝ ඇතුලට ගිලා බැස ඇති හෝ පළුදු වූ ඇසුරුම් සහිත පළිබෝධනාශක බඳුන් මිළදී ගැනීමෙන් වළකිමු.

- ප්‍රවාහනය කරන විටක දී පළිබෝධනාශක භාජනවල මුඩි උඩ පැත්තට සිටින  ලෙස සිරස්ව ඇසිරිය යුතුය.
- පළිබෝධනාශක ප්‍රවාහනයේදී හෝ ගබඩා කිරීමේදී ආහාර සමඟ එකට නොතැබීමට වග බලා ගන්න.
- පළිබෝධනාශක වැඩිපුර මිලදී ගැනීමෙන් සිදුවිය හැකි පහත සඳහන් අවදානම් වළක්වා ගනිමු.
    - පළිබෝධනාශකයේ නිර්දේශයට වඩා වැඩිපුර ප්‍රමාණයකින් හෝ වැඩි වාර ගණනකින් යෙදීමට සිතක් ඇති වීමේ අවදානම.
    - වැඩිපුර මෙන්ම නිතර යෙදීමෙන් පළිබෝධකයින් එම පලිබෝධනශකයට ප්‍රතිරෝධීතාවක් ඇති කර ගැනීමේ අවදානමක් ඇතිවීම.
    - වෙනත් වැදගත් කටයුතු වලට යෙදීමට ඇති මුදල් නිකරුනේ වියදම් වීමට ඇති ඉඩකඩ.



- අනවශ්‍ය ලෙස පළිබෝධනාශක තබා ගැනීමෙන් නිවැසියන්ගේ ආරක්ෂාව පිළිබඳව ඇතිවන අවදානම.
- වැඩිපුර ඉතිරිවන ප්‍රමාණය පරිසරයට මුදා හැරීමේ අවදානම.

▶ එසේම අවශ්‍ය පමණට වඩා අඩුවෙන් මිළදී ගතහොත්, වැඩිපුර ජලය යොදා ඉසීම සිදුවිය හැකි අතර එමගින් පළිබෝධකයා පාලනය නොවීමේ අවදානමක් ඇතිවන බව හොඳින් මතක තබා ගන්න.

## 8 නිසි ප්‍රමිතියෙන් යුතු ඉසිනයක් සහ නොසලයක් (දියර ඉසිනයේ විදින කෙළවර) භාවිතා කරමු.

▶ පළිබෝධනාශක ඉසීමේදී නිසි ප්‍රමිතියෙන් යුතු (විශේෂයෙන්ම කාන්දු නොවන) නිසි ලෙස ක්‍රමාංකනය කල ඉසිනයක් භාවිතා කරන්න.

ඔබේ ඉසිනය ක්‍රමාංකනය කරගැනීමට උපදෙස් අංක 16 දී (පිටු අංක 34) විස්තරකර ඇත

කාන්දු වන ඉසින භාවිතා කරන්න එපා




- දියර ඉසිනයක් භාවිතයට පෙර කරන මුලික පරික්ෂාවේදී පහත කාරණා තහවුරු කරගන්න.


  1. මින් පෙර භාවිතාවෙන් පසු ඉසිනය හොඳින් පිරිසිදු කර තිබෙන බව,
  2. ඉසිනයේ කාන්දු නොමැතිබව,
  3. ඉසිනයේ නොසලය සිරවීම් වලින් තොරව හොඳින් ක්‍රියාත්මක වනබව,
  4. ඉසිනයේ පිස්ටනය හා හැඩලය හොඳින් ක්‍රියාත්මක වනබව,
  5. බල ඉසිනයක් **(Power Sprayer)** නම්, අඛණ්ඩ විදුලි සැපයුමක් ඇති බවට හෝ ප්‍රමාණවත් බැටරි බලයක් ඇති බව,

- ඉසීමට බලාපොරොත්තුවන පළිබෝධනාශකය හෝ වල්නාශකය අනුව හා යෙදීම සිදු කරන අරමුණ අනුව ඊට සුදුසු නොසලයක් තෝරා ගත යුතුයි.

  - වල්නාශක යෙදීමේදී වඩාත් සුදුසු වන්නේ ෆ්ලැට් ෆැන් **(Flat fan)** නොසලයක් භාවිතා කිරීමයි.



- පැළ මතුවීමට පෙර, පස් සමග මිශ්‍ර වනසේ යොදන වල්නාශක යෙදීමට හා දියර පොහොර යෙදීමට වඩාත්ම උචිත වන්නේ ෆ්ලඩ් ෆෑන්/ ෆ්ලඩ් ජෙට් **(Flood Fan/ Flood Jet)** නොසලයි.




- කෘමිනාශක සහ දිලීරනාශක යෙදීම සඳහා වඩාත් සුදුසු වන්නේ **Hollow Cone** ( හොලෝ කෝන්) නොසලයයි. එම නොසලය නිසා ද්‍රව බින්දු හොඳින් විසිරී ගොස් බෝග මත හොඳින් පැතිරේ.
- ඔබ විශාල ප්‍රදේශයක පත්‍ර මතුපිට ඉසීම කරන්නේ නම් හෝ ඔබ සුළං සහිත තත්වයන් යටතේ ඉසීම කරන්නේ නම්, සම්පූර්ණ කේතු ((**Full Cone**) නොසලයක් වඩාත් සුදුසු විය හැකිය.
- මඩ සහිත ජලය භාවිතා කලහොත් සමහර වල්නාශක හා පළිබෝධනාශක වල ක්‍රියාකාරිත්වය අඩු වේ. (උදා; පැරකොට්, ග්ලයිපොසෙට් වැනි වල්නාශක).

- ඒ ඒ අවශ්‍යතාවයට උචිතම නොසල වර්ගය භාවිතා නොකළහොත්

1. පළිබෝධනාශක අපතේ යාම නිසා වැඩිපුර භාවිතා කිරීමට සිදුවීම.
2. අපතේ යන පළිබෝධනාශක නිසා සිදුවන පරිසර හානිය වැඩි වීම.
3. ඉසීමේ ඵලදායිතාව අඩු වීම නිසා මුදල්, කාලය, ශ්‍රමය, අපතේ යාම තුළින් සිදුවන අලාභය වැඩිවීම.

- හිරවූ නොසලයකට මුඛයෙන් පිඹීම නොකලයුතුයි. ඒ වෙනුවට එය ජලයෙන් සේදීම හෝ යතුරුකටුවක්/ ආයාකටුවක් වැනි දෙයක් භාවිතා කර පිරිසිදු කරන්න.
- හැකි සෑම විටකදීම පිරිසිදු ජලය භාවිතා කරන්න එවිට ටැංකිය හෝ නොසල අවහිරවීමද වලක්වා ගත හැක.

**නොසලයට මුඛයෙන් පිඹින්න එපා.**



සෑම විටම යතුරුකටුවක්/ ආයාකටුවක් වැනි දෙයක් භාවිතා කරන්න.



## 9 පළිබෝධනාශක භාවිතයේදී ඔබ නිසි ප්‍රමිතියෙන් යුතු ආරක්ෂිත ඇඳුම් කට්ටලයක් භාවිතා කල යුත්තේ ඇයි?


- පළිබෝධනාශක විෂ සහිතයි. එසේම පළිබෝධනාශක වලට නිරාවරණය වීම මිනිසුන්ට අනතුරුදායක වේ.
- හානිකර බලපෑමක හෝ විෂ වීමක බරපතලකම රඳා පවතින්නේ පළිබෝධනාශකයේ විෂ බව, එය ශරීරයට ඇතුළු වන මාර්ගය, ශරීරයට ඇතුළු වන ප්‍රමාණය සහ නිරාවරණය වන කාලය මත ය.
- අපේ ශරීරයට පහත දක්වා ඇති එක් ක්‍රමයකින් හෝ ක්‍රම කිහිපයකින් පළිබෝධනාශක ඇතුළු විය හැක.



මුඛ මාර්ගයෙන්



ආශ්වාසයෙන්



සම හරහා


**සම මගින්** - පළිබෝධනාශක විසිරීම්, හැලීම්, මිශ්‍ර කිරීමේදී, ඉසීමේදී, අධි පීඩන වාෂ්ප ලෙස වාතයේ පවතින බිඳිති ලෙස හෝ බෝගවල තැවරී තිබීමේදී සම සමග සපර්ෂ වීමෙන් හෝ සම මත තැන්පත්වීමෙන්

**මුඛයෙන්** - පළිබෝධනාශක භාවිතය අතරතුර හෝ අවසානයේ අත් පවිත්‍ර නොකර ආහාර ගැනීම, ජලය පානය කිරිම, දුම්බීම, බුලත්විට කෑම, වැරදීමකින් පානය කිරීම

**ඇස්වලින්** - වාතයේ පවතින බිඳිති, විසිරීම්, හැලීම්, අධි පීඩන වාෂ්ප සහ ඇස් ඇල්ලීම මගින්


**ආශ්වාසය මගින්** - හුස්ම ගැනීමේදී වාතයේ පවතින කුඩා බිඳිති හා වාෂ්ප පෙනහළු තුලට ඇතුළු වීමෙන්

**අපේ ශරීරයේ පළිබෝධනාශක වලට ඉතා සංවේදී ප්‍රදේශ හා ශරීරයේ විවිධ ස්ථාන වලින් පළිබෝධනාශක උරා ගන්නා සීඝ්‍රතාවය පිළිබඳව පහත රූප සටහනින් දැක්වෙනවා.**




කිසියම් කාල පරාසයක් තුළ අතේ යටි බාහුවේ සම හරහා පළිබෝධනාශකයේ ඒකක 1ක් උරා ගන්නවා නම්, එම කාල පරාසය තුළදී ශරීරයේ අනෙකුත් ප්‍රදේශවලින් උරා ගන්නා පළිබෝධනාශකයේ ප්‍රමාණය ඉහත රූපසටහනෙන් දැක්වේ.

- ශරීරය තුළට ඇතුළුවූ පළිබෝධනාශකවල අඩංගු විෂ ද්‍රව්‍ය ලේ සමග මුසු වී ශරීරයේ විවිධ ස්ථාන වලට ගමන් කරයි.
- මෙම විෂ ද්‍රව්‍ය වලින් වැඩි ප්‍රමාණයක් අක්මාව තුළදී බිඳහෙලනු ලබන අතර ඒවා මුත්‍රා ලෙස හෝ දහදිය ලෙස ශරීරයෙන් බැහැර කරනු ලබයි.
- ශරීරය තුල ඉතිරි වන ප්‍රමාණය කුඩා වුනත් දීර්ඝකාලීනව පළිබෝධනාශක වලට නිරාවරණය වීම නිසා ශරීරය තුල එකතුවන ප්‍රමාණය වැඩිවී මිනිසාගේ සෞඛ්‍යට අහිතකර ලෙස බලපෑම් ඇති කිරීමට හැකියාවක් තිබේ.
- මෙසේ ඇතිවිය හැකි රෝගී තත්වයන් ලෙස ස්නායු ආබාධ, ශ්වසන ගැටළු, ප්‍රජනක සෞඛ්‍යට සිදුවන බලපෑම්, පිළිකා සහ අන්තරාසර්ග (හෝමෝන) පද්ධතියේ සිදුවන අසමතුලිතවීම් නිසා ඇතිවන රෝගී තත්වයන් හඳුන්වා දෙන්න පුලුවන්.




සම්පූර්ණ ආරක්ෂිත ඇඳුම් කට්ටලයක් ඇඳගත් ගොවිමහතෙකු මෙම රූපසටහනින් දැක්වේ. එය හොඳින් බලා අවබෝධ කරගන්න.

- සම්පූර්ණ ආරක්ෂිත ඇඳුම් කට්ටලයක්, නිසි ප්‍රමිතියෙන් යුතු අත් වැසුම්, මුව ආවරණ, ඇස් ආවරණ (ගෝගල්ස්), හිස් වැසුම්, ආරක්ෂිත අත් දිග කමිසයක් සහ කලිසම, ඒප්‍රනය සහ බූට් සපත්තු වලින් සමන්විතවේ.

පළිබෝධනාශක භාවිතය අතරතුර ආහාර ගැනීමෙන්, ජලය පානය කිරීමෙන්, දුම්බීමෙන්, බුලත්විට කෑමෙන් වැළකී සිටීමෙන් හා නිසි ප්‍රමිතියෙන් යුතු ආරක්ෂිත ඇඳුම් කට්ටලයක් පැළඳීමෙන් සම හරහා, ශ්වසන මාර්ගයෙන් (ආශ්වාස කිරීම මගින්), ඇස්වලින් සහ මුඛ මාර්ගයෙන් පළිබෝධනාශක ශරීරයට ඇතුල්වීම බෙහෙවින් අඩු කළ හැකි අතර එමගින් පළිබෝධනාශක විෂ වීමේ අවදානම සැලකිය යුතු ලෙස අඩු කළ හැකිය.

## 10 පළිබෝධනාශක මිශ්‍ර කර ගැනීම සහ යෙදීම.

- පළිබෝධනාශක මිශ්‍ර කිරීමේදී හා ඉසීමේදී අත් වැරදීමෙන් ශරීරයේ තැවරීම්, නාස් මාර්ගයෙන් හෝ මුඛ මාර්ගයෙන් ශරීර ගතවීම සිදුවිය හැක.
- ඒ නිසා පළිබෝධනාශක මිශ්‍ර කිරීම හෝ ඉසිම සිදු කලයුත්තේ නිසි ප්‍රමිතියෙන් යුතු පිරිසිදු ආරක්ෂිත ඇඳුම් කට්ටලයක් පැළඳීමෙන් පසුව බව හොඳින් මතක තබා ගත යුතුය.

### 10.1 මිශ්‍ර කර ගැනීම.

- මුලින්ම අදාල පළිබෝධනාශකයෙන් වගා වපසරියට අවශ්‍ය ප්‍රමාණය තීරණය කරගත යුතු වේ.





- ලේබලයේ සඳහන් කොට ඇති ආකාරයට වගා වපසරියට අවශ්‍ය පළිබෝධනාශක මුළු ප්‍රමාණයෙන්, ඉසින ටැංකියේ ධාරිතාවයට අදාළ වන ප්‍රමාණය මැනගෙන, එම ප්‍රමාණය ඉසින ටැංකියට යොදා ඊට පිරිසුදු ජලය එකතුකරමින් මිශ්‍ර කළයුතුය.

- ඒ සඳහා මිලි ලීටර් / ලීටර් සටහන් කර ඇති මිනුම් උපකරණයක් ( මිනුම් සිලින්ඩරයක් හෝ කෝප්පයක්) භාවිතා කරන්න. මෙම මිනුම් භාජනය වෙනත් කිසිදු කටයුත්තට (ආහාර හෝ වෙනත් ද්‍රව්‍ය මැනීමට) භාවිතා නොකිරීමට වග බලා ගන්න.
- ඇතැම් පළිබෝධනාශක ඉසින ටැංකියට අවශ්‍ය ප්‍රමාණයට ගැලපෙන අයුරින් කුඩා අසුරන (කුඩා පැකට් හෝ බෝතල්) ඇති බැවින් වෙනම මැන ගැනීම අවශ්‍ය නොවේ.






- මිශ්‍ර කිරීමේ දී ජල ප්‍රභවයන් ගෙන් ඈත්ව සිදු කරන්න.
- මිශ්‍ර කිරීමේදී සෑම විටම පිරිසිදු ජලය යොදා ගන්න. එමගින් පළිබෝධනාශක නිෂ්පාදනයේ උපරිම ක්‍රියාකාරිත්වය ලබා ගත හැක.
- කැට හෝ කුඩු ආකාරයෙන් ඇති පළිබෝධනාශක වර්ග වෙනම භාජනයක හොඳින් දියකර ගන්න.
- අවශ්‍ය ප්‍රමාණය අඩක් ජලයෙන් පිරවූ දියර ඉසිනයට එකතු කරන්න
- පසුව නියමිත මට්ටම (ලීටර් 16 සලකුණ) තෙක් ජලය එකතු කර හොඳින් මිශ්‍ර කරන්න.
- ද්‍රව්‍ය වත්කිරීමේදී අවශ්‍ය විට පුනීලයක් භාවිතා කරන්න . (එය වෙනත් කිසිදු කටයුත්තක් සඳහා භාවිතා නොකරන්න)

- ඉහිරීම් සිදුවුවහොත් මිනිසුන් හා සතුන් එම ස්ථානයෙන් වහාම ඉවත් කරන්න.
- ඇළ දොළ, ගංගා, ළිං යන ආදී ජල ප්‍රභවයන්ට එක් නොවන ලෙස ඉහිරුණු පළිබෝධනාශක ආරක්ෂාකාරීව සෝදා හරින්න.
- කිසිවිටක අත් වැසුම් නොමැතිව මිශ්‍ර කිරීම් නොකරන්න. මිශ්‍ර කිරීම අවසානයේ පළිබෝධනාශක ඇසුරුම (උදා; බෝතලය) තෙවරක් සෝදා, එම ජලය ද ඉසිනයේ ඇති මිශ්‍රණයටම එකතු කරන්න.

## 10.2 පළිබෝධනාශක ඉසීම/යෙදීම.

- ලේබලයේ නිර්දේශ අනුගමනය කරමින් නිර්දේශිත බෝගයට පමණක් ඉසීම සිදු කරන්න.
- නිර්දේශ කර නොමැති නම්, අනෙකුත් කෘෂි රසායනික ද්‍රව්‍ය සමඟ මිශ්‍ර කර ඉසීමෙන් වළකින්න.
- තදින් හිරු එළිය නොමැති උදේ 10ට පෙර හෝ හවස 4 න් පසු පළිබෝධනාශක ඉසීම වඩාත් සුදුසු වේ.
- සුළඟ හමන දිශාවට ලම්බකව පළිබෝධනාශක ඉසීම වඩාත් ආරක්ෂාකාරී සහ කාර්යක්ෂම ඉසීමක් වේ. (නැතහොත් පළිබෝධනාශක දියරය ඉසින පුද්ගලයා දෙසටම යොමු වේ).




නෙයෙකුත් කෘෂි රසායනික ද්‍රව්‍ය සමඟ මිශ්‍ර කර යෙදීමෙන් වළකින්න.







- ක්ෂේත්‍රයේදී පළිබෝධනාශක ඉසීම ආරම්භ කළ යුත්තේ සුළං හමන දිසාවේ පහළ කෙළවරේ සිට සිග් - සැග් ආකාරයටය.
- වර්ෂාව නොමැති වියලි කාලගුණයක් ඇති අවස්ථා වලදී, කාර්යක්ෂමව පළිබෝධනාශක ශාකයට උරා ගැනීමට නම් පළිබෝධනාශක ඉසීමෙන් පසුව පැය 2 සිට 4 ක පමණ කාලයක් අවශ්‍ය වේ.
- වැස්සට පෙර හෝ වැස්ස අතරතුර ඉසීම සිදුකලේනම්, වර්ෂාව මගින් ඉසින ලද පළිබෝධනාශකය හෝ වල්නාශකය, ශාකය හෝ පළිබෝධකයින් විසින් උරා ගැනීමට පෙර සෝදා යාමක් හෝ ඒවායේ සාන්ද්‍රණය තනුක වීම සිදු වේ. එවැනි ඉසීමක් අකාර්යක්ෂම ඉසීමක් වේ.
- පළිබෝධනාශක ඉසීමෙන් පසු වර්ෂාවක් ඇති වුවහොත්, පළිබෝධනාශකයේ ලේබලයේ සඳහන් උපදෙස් පරිදි නැවත ඉසීම කල යුතුවේ.
- සාදාගත් පළිබෝධනාශක මිශ්‍රණය අවසන් වනතුරු වගාවට හෝ පසට සමාකාරව ඉසින්න.
- වල්නාශක නම් භෝගයට යෙදිය යුතු නියම වයස නිසි ලෙස දැනගෙන ඉසින්න.
- පළිබෝධනාශක යොදා අවම වශයෙන් පැය 12ක් වත් ගත වන තුරු ඔබ හෝ වෙනත් කෙනෙකු හෝ සතුන් එම ප්‍රදේශයට ඇතුල් වීමෙන්/ ඇතුල් කිරීමෙන් වලකින්න.

## 11 පලිබෝධනාශක යෙදීමෙන් පසුව.



- ආරක්ෂිත ඇඳුම් කට්ටලය ගැලවීමට පෙර, ඉසිනය පිරිසිදු ජලයෙන් තුන් වරක් සෝදා, එම ජලය භාවිතයෙන් තොර ස්ථානයක පසට හෝ වලකට යොමු කරන්න.
- අත් වැසුම් ගැලවීමට පෙර ආරක්ෂිත ඇඳුම් ගලවා ඒවා සෝදා පිරිසිදු කරන්න.
- ජලයට පලිබෝධනාශක මිශ්‍ර කිරීම සඳහා භාවිතා කරන ලද සියලුම භාජන පිරිසිදු කරන්න.
- එම අපවිත්‍ර ජලය, ජල ප්‍රභව සමග මුසු නොකිරීමට වග බලා ගන්න.
- අත් වැසුම් ගැලවීමට පෙර ඒවා හොඳින් සෝදන්න. ඉන්පසු අත්වැසුම් ඉවත්කර ආරක්ෂිත ඇඳුම් කට්ටලය සමග හොඳින් වෙලා ගැනීමට වැලක එල්ලන්න.
- අවසානයේදී සබන් හොඳින් ගා ශරීරය පිරිසිදු කරමින් විනාඩි 15 - 20ක් පමණ ස්නානය කරන්න.
- පලිබෝධනාශක යෙදූ දිනය, යෙදූ පලිබෝධනාශකයේ නම, කේත අංකය, යෙදූ ප්‍රමාණය සහ බෝගය, කිනම් පලිබෝධකයා පාලනය කිරීම සඳහාද, ආදී තොරතුරු සටහන් පොතේ ලියා තබා ගන්න. එම සටහන් ඉදිරි පලිබෝධ පාලනය සඳහා වැදගත් වනු ඇත.



## 12 පළිබෝධනාශක ගබඩා කිරීම.



- ඉතිරිවන පළිබෝධනාශක, කුඩා දරුවනට ගත නොහැකි වනසේ සුදුසු ස්ථානයක, ආරක්ෂිතව, යතුරු අගුළුලා ගබඩා කරන්න.
- ගබඩාකර තබන ස්ථානය, කුඩා දරුවන්ගෙන්, ගින්දරින් ඈත්ව පවතින ආරක්ෂිත ස්ථානයක් විය යුතුය.
- හොඳින් වාතාශ්‍රය ලැබෙන හිරු එළිය අඩු ස්ථානයක, කාමර උෂ්ණත්වය යටතේ ගබඩා කරන්න.
- නැවත භාවිතය සඳහා ආරක්ෂිතව ගබඩාකර තබන්නේ නම් එම ද්‍රව්‍ය තිබූ භාජනයේම ගබඩා කරන්න.
- අවශ්‍ය ප්‍රමාණය ලබා ගැනීමෙන් පසු ඉතිරිවන පළිබෝධනාශකය එවෙලෙහිම නිසි ස්ථානයේ ගබඩා කරන්න.
- මිලදී ගත් සියළු පළිබෝධනාශක එකම ස්ථානයේ උචිත ලෙස ගබඩා කරන්න.
- මනුෂ්‍ය ආහාර හෝ සත්ව ආහාර ආසන්නයේ ගබඩා නොකරන්න.
- වල්නාශක, කෘමිනාශක සහ දිලීරනාශක වෙන වෙනම ගබඩා කර තබන්න.
- ඉතා විෂ අධික පළිබෝධනාශක නිෂ්පාදන සාමාන්‍ය වෙළඳපලේ මිලදී ගැනීමට නැති බව සිහි තබා ගන්න. එවැනි ව්‍යාජ නිෂ්පාදන මිලදී ගැනීමෙන් වළකින්න.

## 13 පළිබෝධනාශක ඇසුරුම් බැහැර කිරීම.

- පළිබෝධනාශක භාවිතයෙන් පසුව එම හිස් පැකට් සහ බඳුන් (බෝතල්/කුප්පි) වල ඇති පළිබෝධනාශක ඉවත් වන සේ තෙවරක් සෝදා පිරිසිදු කර, සුදුසු ස්ථානයක, නැවත භාවිතයට ගත නොහැකි ලෙස ගබඩා කර තබන්න.
- සෝදා හරින අපවිත්‍ර වූ ජලය, ජල ප්‍රභව වලට මිශ්‍ර වීමට ඉඩ නොතබන්න. දැනට භාවිතා නොකරන ස්ථානයක පසට හෝ වලකට එම අපවිත්‍ර ජලය බැහැර කරන්න.
- ඉන්පසු එම සෝදා පිරිසිදු කරගත් බඳුන් එකතු කරන මධ්‍යස්ථානයකට බාර දෙන්න.



## 14 ප්‍රථමාධාර ලබාදීම.



- ඔබ ගොවියෙක් නම් හෝ පළිබෝධනාශක ඉසීම සිදුකරන අයෙකු නම්, පළිබෝධනාශක භාවිතයේදී ඊට අදාළ ප්‍රථමාධාර ලබාදීම සම්බන්ධව දැනුවත්ව සිටීම ඉතා වැදගත්.
- පළිබෝධනාශක ලේබලයේද ප්‍රථමාධාර සහ ප්‍රතිවිෂ පිළිබඳව සඳහන් කර ඇත.
- ඔබ පළිබෝධනාශකයකට නිරාවරණය වීමෙන් අනතුරකට ලක් වුවහොත්, වහාම වෛද්‍ය ප්‍රතිකාර ලබාගන්න.

- වෛද්‍යවරයාට ප්‍රතිකාර ලබා දීම පහසු කරවීම සඳහා අදාල පළිබෝධනාශක බෝතලය/බහාලුම හෝ ලේබලය රැගෙන යන්න.
- වෛද්‍යවරයෙකු වෙත අදාළ පුද්ගලයෙකු රැගෙන යාමට ප්‍රථම, ප්‍රමාදයකින් තොරව, ඉතා සැළකිලිමත්ව පහත සඳහන් ප්‍රථමාධාර ලබාදීම වැදගත් වේ.
- **සමේ තැවරුණ විටක,**
  - පළිබෝධනාශක සම මත තැවරිමකදී, පලිබෝධනාශක තැවරී ඇති ඇඳුම් නොපමාව ඉවත් කරන්න.
  - සම සහ හිසකෙස් සබන් ගා අවම වශයෙන් මිනිත්තු 15ක් පමණ පිරිසිදු වතුරෙන් හොඳින් සෝදන්න.
- **ඇසෙහි තැවරුන විටකදී,**
  - හැකි ඉක්මණින් පිරිසිදු ජලයෙන් ඇස පිරිසිදු කරන්න.
  - ඇසිපිය හොඳින් විවෘත කොට සෙමින් ගලා යන පිරිසිදු ජලයෙන් විනඩි 15ක් පමණ ඇස සෝදන්න. (සබන් ගෑමෙන් වළකින්න)
- **ආශ්වාසය මඟින් විෂවීම ඇති වූ විට,**
  - අදාල පුද්ගලයා වාතාශ්‍රය ඇති, හිරු එළිය තදින් නොවැටෙන තැනකට ගෙනයන්න.
  - ඔහු/ඇය නිසලව උඩබැලි අතට දිගහැර තබන්න.
  - සියළුම තද ඇඳුම් ලිහිල් කරන්න.
  - අවශ්‍ය නම් කෘතීම ශ්වසනය දෙන්න.
  - ශරීරය සීතලවේ නම් පොරවා උණුසුම් කරන්න.



වැඩිදුර අවශ්‍ය උපදෙස් සඳහා ක්ෂණික ඇමතුම් අංකය **011-2691111** ඔස්සේ ජාතික විෂ තොරතුරු මධ්‍යස්ථානය අමතන්න.




## මුඛය තුළින් විෂවීමකදී,

- බෝතලයේ උපදෙස් කියවා වමනය කරවිය යුතුදැයි ඉක්මණින් තීරණය කරන්න.
- වමනය කරවීමට උත්සාහ කල යුත්තේ අදාළ පුද්ගලයාට සිහිය තිබේ නම් පමණක් බව මතක තබා ගත යුතුය.
- වමනය කරවීම සඳහා ලේබලයේ උපදෙස් ලබාදී ඇත්නම් හා පළිබෝධනාශක පෙවී ඇති පුද්ගලයාට සිහිය හොඳින් ඇත්නම් පමණක්, වමනය කරවීම සඳහා ප්‍රථමාධාර දෙන්නාගේ අත හොඳින් පිරිසිදු කර ඇඟිල්ලක් රෝගියාගේ උගුර තුළට ප්‍රවේශමෙන් යවා කිති කැවීම කළ හැක. මෙහිදී ප්‍රථමාධාර ලබා දෙන්නාද ප්‍රවේශම් වීමට වග බලා ගන්න.
- **වමනය කරවීමේදී අදාළ පුද්ගලයාගේ මුහණ යටි පැත්තට සිටින සේ හරවා තබන්න.** එසේ නොකර උඩුබැලි අතටම හිඳුවා වමනය කරවීම කළහොත්, වමනය ලෙස පිටවන දේ ශ්වසන මාර්ගය අවහිර කරනු ඇත. එය ඉතාමත් අවදානම් තත්වයක් ඇති කරනු ඇත.
- එසේම, මුඛයේ ආහාර ද්‍රව්‍ය හෝ සෙම පිරී ඇති දැයි පරීක්ෂා කොට, එසේ වේ නම් ඉක්මනින් පිරිසිදු කරන්න.

## 15 තෙල් ටැංකි කීයක් ගහන්න වෙනවද? කොහොමද ඒක හිතා ගන්නෙ?

- පළිබෝධනාශක ලේබලයේ පැහැදිලිව තියන තොරතුරු කියවන කෙනෙකුට මේ කියන දේ හරිම සරලව කර ගන්න පුළුවන්.
- පළිබෝධනාශක ලේබලයෙම කියලා තියෙනවා, හෙක්ටයාරයක වගා වපසරියකට හෝ අක්කරයකට එම පළිබෝධනාශකයෙන් යොදන්න ඕන ප්‍රමාණය.
- එම ප්‍රමාණය ග්‍රෑම් වලින් හෝ මිලි ලීටර් හෝ ලීටර වලින් සඳහන් කරලා තියනවා.
- ඉහත ප්‍රමාණය හෙක්ටයාරයකට විතරක් නම් කියලා තියෙන්නේ, ඒක අක්කරයක්ට කොච්චර ද කියලා බලන්න 2.5 න් බෙදන්න ඕන)
- ඒ වගෙම ලේබලයේ ඉතාම පැහැදිලිව කියලා තියෙන්වා ලීටර 16 යේ ඉසින ටැංකියකට එම පළිබෝධනාශකයෙන් එක වරකට යොදන්න ඕන ප්‍රමාණය
- මේ කතාව උදාහරණයකින්ම මෙන්න මේ විදියට තේරුම් ගනිමු.
  - හිතන්න පළිබෝධනාශක ලේබලයේ සඳහන් කරලා තියන්වා හෙක්ටයාරයකට (අක්කර නම් 2.5) යොදන්න ඕන පළිබෝධනාශක ප්‍රමාණය ග්‍රෑම් 100 කියලා.



- ඒක තව විදියකට කිව්වොත් මේ ග්‍රෑම් 100 ප්‍රමාණය යොදන්න ඕන අක්කර නම් 2.5 ක වගා වපසරියකට .

▶ හැබැයි ඔබේ  වගා බිමේ ප්‍රමාණය අක්කර භාගයයි (1/2).

- එහෙමනම් දැන් අපි අක්කර 1/2 කට අවශ්‍ය පළිබෝධනාශක ප්‍රමාණය (ග්‍රෑම් ගණන) සොයාගන්නේ කොහොමද කියල බලමු
- මුලින්ම අක්කරකට ඕන ග්‍රෑම් ප්‍රමාණය සොයාගමු

$$\frac{100g}{2.5} = 40g$$

- ඊළගට අක්කර භාගයකට 1/2 අවශ්‍ය ග්‍රෑම් ප්‍රමාණය සොයාගමු

$$\frac{40g}{2} = 20g$$

- දැන් ඔබ දක්නව අක්කර 1/2 කට  ඕන පළිබෝධනශක ප්‍රමාණය ග්‍රෑම් 20 යි කියලා.

▶ දැන් බලමු 20g යොදන්න ටැංකි කීයක්  ඉසින්න ඕන ද කියල

- ලේබල් එකේ තියන්වා ලීටර 16 යේ ටැංකියකට මෙම පළිබෝධනාශකයෙන් දැමිය යුත්තේ ග්‍රෑම් 4ක් පමණයි කියලා.
- ඒ අනුව, ලීටර 16 ටැංකියයකට එක වතාවකදී ග්‍රෑම් 4ක් යොදලා දියරය ඉසිනවනම්,

- පළිබෝධනාශක ග්‍රෑම් 20 ක් ඉසීම සඳහා ටැංකි 5ක් ඕන වෙනවා කියල පහත පරිදි ගණනය කරගන්න පුළුවන්

| | |
|---|---|
| ග්‍රෑම් 20 ක් ඉසීම සඳහා අවශ්‍ය ටැංකි ගණන | $\frac{20g}{4g} = 5$ |

- ඒ කියන්නේ එකවරකට ග්‍රෑම් 4 ගානේ යොදලා වතුර දියකරලා හදාගන්න ටැංකි 5 ක්ම යොදා ගන්න වෙනවා මේ අක්කර භාගෙට අවශ්‍ය පළිබෝධනාශක ඉසින්න.

## 16 පළිබෝධනාශක ප්‍රමාණය සමානව ඉසින්නේ කොහොමද ?

- ඔයාගේ අක්කර භාගෙට ගහන්න ඕන ටැංකි  ගණන 5යි කියලා දැනගත්තම, වගාව පුරා සමාකාරව ඉසින්න බැරි ඇයි?
- පුළුවන් වගේ හිතුනට, හරියට සැළසුම් නොකර ඉසින්න පටන් ගත්තොත්,
  - එක්කෝ හෙමින් ගැහුව නිසා අක්කර භාගෙටම සම්පූර්ණ කරගන්න බැරිව පළිබෝධනාශක මදි වේවි. වේගෙන් ගැහුවොත් පළිබෝධනාශක ප්‍රමාණයක් ඉතිරි වේවි.
- මේ වැඩේ සරලව කම්මැලි නොවී කර ගන්නේ කොහොමද කියල බලමු.
  - ටැංකියේ ලීටර 16 ලකුණ දක්වා පිරිසිදු වතුරෙන් පුරවන්න.

- ඔයා සාමාන්‍යයෙන් තෙල් (පළිබෝධනාශක) ගහගෙන ඇවිදගෙන ඉදිරියට යන ආකාරයටම තෙල් වෙනුවට වතුර වගා භූමිය පුරාවට ඉසින්න.
- එම වතුර ටැංකිය මුළුමනින් හිස් වන තෙක් සාමාන්‍ය ආකාරයට ඉසීමෙන් තෙත් වූ වපසරිය දෙස බලා එම කලාපයේ විශාලත්වය අනුව, මුළු අක්කර භාගය එවැනි තවත් කලාප කීයකට බෙදා වෙන්කල හැකිදැයි තක්සෙරු කරගන්න.
- ඔබේ ඉසීමේ වේගය හා රිද්මය හරියටම ගැළපේ නම් එවැනි කලාප 5ක් යනු අක්කර භාගයක් වපසරියකි.
- නමුත් සමාන්‍ය ජීවිතයේ දී එසේ හරියටම ගැළපීම සිදු නොවේ.
- ඒ අනුව, එක ටැංකියකින් ආවරණය වන කලාපය මඳක් විශාල නම්, ඔබේ ඉසීමේ වේගය මඳක් අඩුකර, මනා තක්සේරුවක් ඇතිව පළිබෝධනාශක දියර ටැංකි 5ක් සමාන්තරව යොදා අක්කර භාගයක වපසරිය සම්පූර්ණ කළ හැකිවේ.
- එක ටැංකියකින් ආවරණය වූ කලාපය මදක් කුඩා වුනි නම්, ඉන් කියවෙන්නේ ඔබගේ ඉසීමේ වේගය තවත් පොඩි ප්‍රමාණයකින් වේගවත් කළයුතු බවයි.
- එසේ වේගවත් නොකළහොත්, අක්කර භාගයට යෙදීමට වැඩිපුර පළිබෝධනාශක අවශ්‍යවනු ඇත.
- මෙම තක්සේරු කර ගැනීම හරියටම කරගත්තොත්; තෙල් ගහන එක වරදින්නේ නැහැ. '

- තෙල් අඩුවෙන් වැදුනොත් භෝගය ආරක්ෂා වෙන්නෙ නැහැ. අනික පළිබෝධකයෝ හිටියටත් වඩා ඔරොත්තු දෙන තත්වයට එනවා.
- වැඩිපුර ගහන්න උනොත් වියදම්ක් වැඩිවෙනවා පරිසරයටත් හානි වෙනවා. සමහර විට නොසිතූ ලෙස පළිබෝධකයෝ වැඩිපුර ප්‍රමාණවලටත් හුරු වෙන්නත් ඉඩ තියනවා.
- ඔබ මේ වැඩේ කම්මැලි නැතිව කරන කෙනෙක් නම් කීප වතාවක්ම මේ වතුර ඉසීමේ අභ්‍යාසය කරලා, ඔබේ ඉසීමේ වේගය සහ ඇවිදගෙන ඉදිරියට යාමේ වේගය ගැන තේරුම් ගෙන හරිම වේගය හඳුනා ගන්න.
- ඒ හඳුනාගැනීම ජීවිත කාලෙටම ඔයා වෙනුවෙන් කරන හොඳ අයෝජනයක් වේවි.
- මොකද ඔයා වැඩිපුර පලිබෝධනාශක  භාවිතා නොකරන නිසා ඔයාගේ වියදම අඩුවේවි. ඒ වගේම පරිසරයත් ආරක්ෂා වේවි.



| දිනය | සටහන් |
| --- | --- |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

## ප්‍රකාශන හිමිකම

ප්‍රකාශන හිමිකම © 2025 කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

**සියලුම හිමිකම් ඇවිරිණි.**

මෙම පොතේ අඩංගු කරුණු හා නිදර්ශන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දේපළක් වන අතර මෙම ප්‍රකාශනය හෝ නිදර්ශන වෙන වෙනම ප්‍රතිනිෂ්පාදනය කිරීමට අවශ්‍ය ලිඛිත අවසරය සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව අමතන්න.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
තැපැල් පෙට්ටිය 01,
පේරාදෙණිය, ශ්‍රී ලංකාව
දුරකථන අංකය - +94 812 388 331
විද්‍යුත් තැපැල - info@doa.gov.lk
වෙබ් අඩවිය - www.doa.gov.lk

# පළිබෝධනාශක ඇසුරුමේ ඇති ලේබලය අපට බොහෝ තොරතුරු ලබා දෙයි.

M2

දිලීරනාශකයකි/ මයිටනාශකයකි
பங்கசு நாசினி/ சிற்றுண்ணி நாசினி
FUNGICIDE/ MITICIDE

අනිවාර්යෙන් අගුළු ලා තැබිය යුතුයි. බඳුන විවෘත කිරීමට පෙර ආරක්ෂක උපදෙස් හොඳින් කියවන්න.
பூட்டப்பட்டிருக்க வேண்டும். கொள்கலனைத் திறப்பதற்கு முன் பாதுகாப்பு வழிமுறைகளை கவனமாகப் படியுங்கள்.

විෂ
விஷம்
POISON

## එ බි සි සල්ෆර්

සල්ෆර් 80% (බර අනුව) ඩබ්.ජී.

## ஏ பி சி கந்தகம்

கந்தகம் 80% (நிறையளவு) டபிள்யூ.ஜி.

## A B C SULPHUR

**Sulphur 80% (W/W) WG**

M2

කේතය සහිත දිලීරනාශක එක් ක්ෂේත්‍රයක් සඳහා අඛණ්ඩව දීමෙන් වලකින්න.
குறியீட்டு பூஞ்சைக் கொல்லிகளை ஒரே பகுதியில் தொடர்ந்து பயன்படுத்துவதைத் தவிர்க்கவும்.

පෙර අස්වනු කාලය දින 14 යි. අවශ්‍ය නම් නැවත යෙදීම දින 10-14 අතර කාල පරාසයකින් සිදුකරන්න.
அறுவடைக்கு முந்தைய காலம் 14 நாட்கள். தேவைப்பட்டால், 10-14 நாட்கள் இடைவெளியில் மீண்டும் பயன்படுத்தவும்.

ලියාපදිංචි කරන ලදී. பதிவு செய்யப்பட்டது. Registered.

| | | | | |
|---|---|---|---|---|
| ලි. ප. අංකය: எல். பி. எண்: Reg. No: | M3405657 | | කාණ්ඩ අංකය: தொகுதி எண்: Batch No : | 0851218 |
| සක්‍රිය කාලය: செயலில் உள்ள நேரம்: Shelf Life: | 2 | වසර ஆண்டு Years | නිෂ්පාදිත දිනය: உற்பத்தி தேதி: Date of Manufacturing: | 13.08.2025 |
| නිෂ්පාදිත රට: உற்பத்தி நாடு: Country of Origin: | ජර්මනිය ஜெர்மனி Germany | | නැවත ඇසුරුම් කල දිනය மறு தொகுப்பு தேதி: Date of Re-Packing : | 13.10.2025 |
| ශුද්ධ පරිමාව: நிகர அளவு: Net Content: | 200 | ග්‍රෑම් கிராம் gram | උපරිම සිල්ලර මිල (රු): அதிகபட்ச சில்லறை விலை (ரூ.) Maximum Retail : Price (Rs.): | 1,100/- |

ආයතන අංකය / நிறுவன எண் / Establishment No: ROP-IN/VIX/C4

ලියාපදිංචිය: ඒ බී සී හෝල්ඩින් පීඑල්සී සමාගම, තැ. පෙ. 1056, ගැටඹේ, පේරාදෙණිය.
பதிவு செய்பவர்: ஏ பி சி ஹோல்டிங் பிஎல்சி, பி.ஓ. பெட்டி 1056, கட்டபே, பேராதனை.
Registrant: A B C Holding PLC, P.O. Box 1056, Gatabe, Peradeniya.
දු.ක. / தொ.பேசி. / TEL 081 238 8135

A B C Holding

තරමක් අවදානම් සහිතයි
சற்று ஆபத்தானது
SLIGHTLY DANGEROUS

කේත අංකය

පෙර අස්වනු කාලය

ලියාපදිංචි කළ බව සඳහන් තීරුව

නිෂ්පාදිත දිනය

ජීව කාලය

ලියාපදිංචි තොරතුරු

වර්ණ දාරය

අවවාද සංකේත